# වියුක්ත චින්තනයට ක්‍රිස්තුස් වහන්සේගේ අභියෝගය

ක්‍රිස්තුස් වහන්සේ තම ඉගැන්වීම් කටයුතු ආරම්භ කර ඇත්තේ අවුරුදු තිහේ දී පමණ ය. බොහෝ දෙනා තම වැදගත් නිර්මාණ කරන්නේ වයස අවුරුදු විසිපහ සහ හතළිහ අතර කාලයෙහි දී ය. ක්‍රිස්තුස් වහන්සේ තම වැදගත් ම දැනුම ප්‍රකාශ කිරීමට පටන්ගෙන ඇත්තේ ද ඒ වයස් පරාසයෙහි ය. ඒ අතින් එහි පුදුම වීමට කරුණක් නැත. බුදුන් වහන්සේ දැනුමක් නිර්මාණය නොකළ ද උන්වහන්සේ බුද්ධත්වයට පත්වූයේ ද ඉහත සඳහන් වයස් පරාසයෙහි ය. අයින්ස්ටයින් විශේෂ සාපේක්ෂතාවාදය, ප්‍රකාශ විද්‍යුත් ආවරණය ආදිය නිර්මාණය කරන විට වයස විසිහයක් පමණ විය. බොහෝ විට බොහෝ දෙනා අවුරුදු හතළිහෙන් පමණ පසුව කරන්නේ එතෙක් නිර්මාණය කළ දෑ ඔප කිරීම ය.

එහෙත් මේ සියළු දෙනාම පාහේ තම වැදගත් නිර්මාණය සඳහා කලක් තිස්සේ සූදානම් වෙති. ඒ අද නම් පාසල් හා විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය ඔස්සේ කෙරෙයි. බුදුන් වහන්සේ නිර්මාණයක් නොකළ ද බුද්ධත්වයට පත්වීමට පෙර සිදුහත් තවුසාණෝ විවිධ ගුරුකුළවල විවිධ ආකාරයෙන් අභ්‍යාසවල නිරතවූහ. එහෙත් ක්‍රිස්තුස් වහන්සේ ගැන එතරම් දෙයක් පැහැදිලිව සඳහන් නො වේ. එතුමා අවුරුදු දහයක් පමණ සාමාන්‍ය කාර්මිකයකු ලෙස සේවය කළ බව පමණක් කියැවෙයි. ඇතැමුන්ට එතුමා මේ කාලයෙහි ඉන්දියාවේ (භාරතයේ) සිටි බව කීමට හැකි වී ඇත්තේ ද එතුමාගේ පෙර ජීවිතය පිළිබඳ විස්තර බයිබලයෙහි සඳහන් නොවීම හේතු කොටගෙන ය.

ඒ කෙසේ වෙතත් එතුමාට භාරතයෙන් විෂ්ණු අවතාර පිළිබඳ දැනුම කිසියම් ආකාරයකට ලබාගන්නට ඇතැයි සිතමු. ඒ දැනුමත් සමග නිර්මාණශීලී ක්‍රිස්තුස් වහන්සේ තමන් දෙවියන් වහන්සේගේ පුත්‍රයා බවත් පුත්‍රයාගේ වෙසින් මනු ලොවට පැමිණි බවත් සඳහන් නව දැනුමක් නිපදවා ඇති බව පැහැදිලි ය. මේ නිර්මාණයෙන් සන්නද්ධව උන්වහන්සේ යුදෙව්වන්ට හා ඔවුන්ගේ සංස්කෘතියට විරුද්ධ ව දැනුමක් ඉගැන්වීමට පටන් ගෙන ඇත. කලින් සඳහන් කළ පරිදි ඒ ඉගැන්වීම් වැඩිකල් නොගොස් ම නැවැත්වීමට යුදෙව්වෝ සමත් වූහ.

ක්‍රිස්තුස් වහන්සේ යුදෙව් පාරසිවරුන් නමින් හඳුන්වනු යුදෙව් පූජකයන්ට විරුද්ධව ඔවුන්ගේ දේවාලවල සටයුතු කෙළේ ය. ඇතැම් විට පූජා භාණ්ඩවලට පහර දුන්නේ ය. එවැනි මට්ටමකට ඇද වැටුණත් උන්වහන්සේගේ වැඩ පිළිවෙළ එක්තරා ආකාරයකින් ගත්කල විප්ලවීය වූවක් විය. යුදෙව් ආගමට හා පූජකයන්ට විරුද්ධව ක්‍රිස්තුස් වහන්සේ එවැනි ක්‍රියාමාර්ගයකට එළඹියේ ඇයි දැයි කීමට අපි නො දනිමු. යුදෙව් ආගම හා පූජකයන් විසින් ජනතාව මර්දනය කරනු ලැබිණි ද එසේත් නැත්නම් ක්‍රිස්තුස් වහන්සේ ඇතුළු කිහිප දෙනකු මර්දනයට භාජනය කරනු ලැබිණි ද ආදිය පිළිබඳ ව නිශ්චිත ව යමක් කීමට නො හැකි ය.

යම්කිසි ආකාරයක මර්දනයක් නිසා ක්‍රිස්තුස් වහන්සේ යුදෙව් ආගමට අභියෝග කරමින් නැගී සිටියේ ද එසේත් නැත්නම් තමන් දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව කියමින් අලුත් ඉගැන්වීමක යෙදුණ නිසා යුදෙව් පූජකයන්ගේ විරෝධය ක්‍රිස්තුස් වහන්සේ වෙත එල්ල විණි ද යන්න පිළිබඳ තීරණයක් ගැනීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි බයිබලයෙන් නො ලැබෙයි. එහෙත් අවසානයේ දී ක්‍රිස්තුස් වහන්සේට ආධාරයට එතරම් පිරිසක් යුදෙව් සමාජයෙහි නො සිටි බව පැහැදිලි ය.

ඇතැමුන් කියන ආකාරයට ක්‍රිස්තුස් වහන්සේ සමග විශේෂ සම්බන්ධකමක් ඇතිව සිටි මග්දලානේ මරියා නම් කාන්තාව සහ ගෝලයන් හැරෙන්නට වැඩි පිරිසක් උන්වහන්සේ සමග නො සිටියහ. ගෝලයන්ගෙන් ද ජුදාස් නම් තැනැත්තා අවසානයේ දී උන්වහන්සේ පාවා දුන්නේ ය. අවසානයේ දී ක්‍රිස්තුස් වහන්සේ මරණයට පත්කරන ලෙස ඉල්ලා සිටියෝ ද යුදෙව්වෝ ය. මෙයින් පැහැදිලි වන්නේ කිනම් හේතුවක් නිසා විප්ලවය පටන් ගත්ත ද යුදෙව්වන් අතර එය අසාර්ථක වී ඇති බව ය.

යුදෙව්වන් අතර අසාර්ථක වුව ද එය චින්තන විප්ලවයක් විය. එතෙක් ඇති වූ අනෙක් චින්තන විප්ලව මෙන් ම එය ද ආසියාවේ ඇති වූ චින්තන විප්ලවයක් විය. විශේෂයෙන් ම ඒ බටහිර ආසියාවේ ඇති වූ චින්තන විප්ලවයක් විය. බටහිර ආසියාවේ යුදෙව්වන් අතර තිබූ වියුක්ත චින්තනය එමගින් අභියෝගයට ලක්විය. ඇතැමුන් සිතන ආකාරයට

© Prof. Nalin De Silva

නොව මුල දී වියුක්ත චින්තනය බටහිර ඇති නො වී ය. වියුක්ත චින්තනය ද ඇතිවූයේ බටහිර ආසියාවේ ය. ආසියාවේ බටහිර පිහිටි කාන්තරවල වියුක්ත චින්තනය බිහි වී ඇත.

ක්‍රිස්තුස් වහන්සේ ආසියාවෙන් ම පැන නැගී දඹදිව වෛදික චින්තනයෙන් යම් ආභාසයක් ලබා වියුක්ත චින්තනය අභියෝගයට ලක් කෙළේ යැයි කිව හැකි ය.. එතෙක් පැවති වියුක්ත යුදෙව් දෙවියන් වහන්සේ උන්වහන්සේ විසින් සංයුක්ත දෙවියන් වහන්සේ කෙනකු බවට පත්කරනු ලැබූහ. ක්‍රිස්තුස් වහන්සේ තම චින්තනයට වෛදිකයන් අනුව යමින් ත්‍රිකෝටික න්‍යාය එකතු කෙළේ ය. එහෙත් එතුමාගේ විප්ලවයෙහි දේශපාලන සංරචකයක් ද විය. යුදෙව්වන් වඩාත් ම විරුද්ධ වන්නට ඇත්තේ මේ දේශපාලන සංරචකයට ය.

ක්‍රිස්තුස් වහන්සේගේ මරණයෙන් පසුව උන්වහන්සේගේ චින්තන විප්ලවය යුදෙව්වන් අතර පැතිර ගොස් ඇති බවක් නො පෙනෙයි. එහෙත් ඇතැම් විට මේ නව චින්තනය රෝමයන් අතර බුද්ධිමතුන්ගේ සාකච්ඡාවට බඳුන් වන්නට ඇතැයි සිතිය හැකි ය. රෝමයන්ට ප්‍රබුද්ධ චින්තනයක් තිබී බවට සාක්ෂි නො මැත. ග්‍රීකයන්ගේ ස්වසිද්ධිමය පද්ධතීන් රෝමයන්ට දිරවා ගත හැකි වූ බවක් නො පෙනෙයි. ද්විකෝටික න්‍යාය පවා ඔවුන් විසින් ගුරුකොට ගනු නොලැබූ බව පැහැදිලි වෙයි. රෝමයන්ගේ නීති පද්ධතිය ගොඩනැගෙන්නේ හුදෙක් ඇරිස්ටෝටලීය න්‍යාය මත පදනම් වී නො වේ. රෝමයන්ගේ නීතිය (අද වන විට එය රෝම ලන්දේසි නීතිය සහ වෙනත් නීති ලෙස විකාශය වී ඇත) සාමාන්‍ය අවස්ථාවන්හි දී ද්විකෝටික න්‍යාය මත පදනම් වුව ද ව්‍යතිරේක වෙනත් න්‍යායක් මත පදනම් වෙයි.

කෙසේ වෙතත් ක්‍රිස්තුස් වහන්සේගේ චින්තනය රෝමයේ හා පසුව රෝම අධිරාජයේ ප්‍රචලිත වීමට පටන්ගෙන ඇති බව පෙනෙයි. මේ සංසිද්ධිය තවදුරත් හැදෑරිය යුතු ය. විශේෂයෙන් ම තුන්වැනි සියවසෙන් පසුව ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් ආගමක් ලෙස රෝම අධිරාජ්‍යයේ පැතිර ගොස් ඇත. එයට හේතුව රෝම අධිරාජ්‍යය විසින් නිල වශයෙන් කතෝලික ආගම ලෙස නම් කෙරුණු මේ නව ආගම පිළිගැනීම ම නො වේ. කතෝලික ආගමේ පැන නැගීමට හේතු වූ කතෝලික චින්තනය ඒ වන විට ද රෝම අධිරාජ්‍යයේ ප්‍රචලිත ව තිබිණි යැයි සිතිය හැකි ය.

අධිරාජ්‍යයක් පවත්වාගෙන යෑම යනු හුදු දේශපාලනික කටයුත්තක් පමණක් නො වේ. අධිරාජ්‍යයක නොව රාජ්‍යයක පැවැත්ම ද හුදු දේශපාලන කාර්යයක් නො වෙයි. දේශපාලනය හා බැඳුණු ආර්ථික හා සංස්කෘතික සංරචක ද එහි දී වැදගත් වෙයි. රාජ්‍යයක් හෝ අධිරාජ්‍යයක් හෝ පිහිටුවීම ප්‍රධාන වශයෙන් ම දේශපාලන කටයුත්තකි. වඩාත් අසීරු කාර්යය රාජ්‍යයක් හෝ අධිරාජ්‍යයක් හෝ පිහිටුවීම නොව ඒ පවත්වා ගෙන යෑම ය. එහි දී ආර්ථික හා විශේෂයෙන් ම සංස්කෘතික සංරචක වැදගත් කාර්යභාරයක් ඉටුකරයි.

ලෝක ඉතිහාසයේ සාර්ථක ම අධිරාජ්‍යයක් වූ බ්‍රිතානි අධිරාජ්‍යය පවත්වාගෙන ගියේ හුදෙක් හමුදාවේ පිහිටෙන් නො වේ. භාරතය ඉන්දියාවක් බවට පත්කළ බ්‍රිතානියෝ මුළු මහත් ඉන්දියාව ම පාලනය කිරීමට එතරම් විශාල හමුදාවක් යොදා නොගත්හ. ඔවුහු සංස්කෘතික සංරචකය උපරිම ලෙස යොදා ගත්හ. චෝල අධිරාජයෙහි දෙමළ බස ව්‍යාප්ත නො විණි. අග්නිදිග ආසියාවේ ඈතට චෝල අධිරාජ්‍යය විහිදි නමුත් දෙමළ බස කතාකරන්නවුන් සුළු පිරිසක්වත් ඇති කිරීමට සොළීහු අසමත් වූහ.

චෝල අධිරාජ්‍යය ලංකාවෙහි ද බොහෝ ප්‍රදේශවල ව්‍යාප්ත වූ නමුදු එහි සංස්කෘතික බලපෑම අල්ප විය. පොළොන්නරුවෙහි කෝවිල් කිහිපයක් සොළීන් විසින් ම ඇති කරනු ලැබීම හැරෙන්නට මුළු රට පුරා විහිදුණු චෝල සංස්කෘතියක් ඇති කරන්නට චෝලයෝ අසමත් වූහ. ද්‍රවිඩ සංස්කෘතික බලපෑම් සිංහලය කෙරෙහි ඇතිවීමට පටන් ගෙන ඇත්තේ පසු කාලීනව සිංහල රාජ්‍යයට සංක්‍රමණය වූ විවිධ ද්‍රවිඩ ගෝත්‍ර හේතුකොටගෙන ය.

එහෙත් බ්‍රිතානි අධිරාජ්‍යයේ සංස්කෘතික බලපෑම එසේ නො වේ. අද වන විට ඉංගිරිසි භාෂාව ලෝකයේ දැනුම් පිළිබඳ නොනිල මාධ්‍යය බවට පත් වී ඇත. රෝම අධිරාජ්‍යයෙහි ද එවැනි තත්වයක් තිබූ බව පැහැදිලි ය. ලතින් භාෂාව පසුකාලීනව රෝම අධිරාජ්‍යයෙහි දැනුමේ මාධ්‍යය බවට පත් වී තිබුණි. මෑතක් වන තුරුම ඇතැම් විෂය සම්බන්ධයෙන් ලතින් භාෂාව අනිවාර්යයෙන් ම දැනගත යුතු විය. නිව්ටන් ආදීන් තම කෘති පළ කෙළේ ලතින් භාෂාවෙනි.

© Prof. Nalin De Silva

බ්‍රිතාන්‍යයන් අපට කර ඇත්තේ රෝමයන් තම අධිරාජ්‍යයට කළාට වැඩි බලපෑමකි. අද ඉංගිරිසිය නොමැතිව කිසිවක් නොකළ හැකි තත්වයක් ඇතැයි සිතීමට අප තල්ලු කිරීමට ඔවුන් කටයුතු කර ඇත. ඉංගිරිසියෙහි ඇති වැදගත්කම අපට තවදුරටත් බ්‍රිතාන්‍යයන් පැමිණ කියා දිය යුතු නැති තැනකට පත් වී ඇත. අපට ඒ සඳහා අපේ ම වූ පිරිස් වෙති. ඔවුහු බ්‍රිතාන්‍යයන්ට ද වඩා ඉංගිරිසියෙහි ඇති වැදගත්කම අපට කියා දෙති. අද පරිගණකයෙහි ව්‍යාප්තියත් සමග ඉංගිරිසියෙහි ඇති වැදගත්කම තවත් වැඩි වී ඇැයි කියැවෙයි.

එපමණක් නො වේ. ක්‍රිකට් අද ලංකාව ඉන්දියාව වැනි පැරණි බ්‍රිතාන්‍ය අධිරාජයෙහි රටවල ජාතික ක්‍රීඩාව බවට පත් වී ඇත. ක්‍රිකට් අද මෙරට සංස්කෘතියෙහි වැදගත් තැනක් අත්කර ගෙන සිටියි. බ්‍රිතාන්‍යයන් අද ද මෙරට දේශපාලනයට ඇඟිලි ගසන බව පැහැදිලි ය. එහෙත් ඔවුන්ගෙන් අපට බලපෑම වඩාත් ම ඇත්තේ සංස්කෘතික වශයෙනි. බ්‍රිතාන්‍යයන් මෙරට දේශපාලනයෙන් මුළුමනින් ම ඈත් වූ දවසක ද (ඒ දිනය එතරම් ළඟ නම් නො වේ.) බ්‍රිතාන්‍යයන් සංස්කෘතික වශයෙන් අප පාලනය කරනු ඇත.

බ්‍රිතාන්‍යයෝ මුළු ඉන්දියාව ම පාලනය කෙළේ අවසානයේ දී ඉන්දියාවෙන් ම බිහිකරනු ලැබූ නිලධාරි තන්ත්‍රයක් ඇසුරෙන් ය. මේ නිලධාරීහු බොහෝමයක් බ්‍රාහ්මණ වංශයට අයත් වූහ. ඔවුන් එක්කරනු ලැබුයේ ඔවුන්ගේ පොදු බ්‍රාහ්මණ බවටත් වඩා ඔවුන් භාවිතා කළ ඉංගිරිසිය මගිනි. අද ඉන්දියාව එක් කෙරී ඇත්තේ ඉංගිරිසි භාෂාව මගිනි. බ්‍රිතාන්‍යයන් අපට වෛර කරන එක් ප්‍රධාන හේතුවක් නම් අප සිංහලය ඔස්සේ ලංකාව එකරාශී කර තිබීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva